ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ (“කාර්යාංශය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VIII වන පරිච්ඡේදයේ 42 වගන්තියේ (ආ),(ඉ) සහ (ඌ) උපවගන්ති	සංචාරක වෙළඳපලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදුකිරීමට වග බලාගැනීම සඳහා සැලසුම් කළ පොදු ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම, සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන ආදී වැඩසටහන් වල නිරත තැනැත්තන්ට සහ සංවිධාන වලට වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට මගපෙන්වීම කාර්යාංශයේ අරමුණ වේ. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය වන විට කාර්යාංශය එම අරමුණ ඉටුකර නොතිබුණි.	සංචාරක කර්මාන්තයේ ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් පොදු ප්‍රතිපත්තියක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමේ ප්‍රමාදයට හේතුව වත්මන් වෙළඳපල ව්‍යුහය වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සහ සංචාරක ආයතන ඒකාබද්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලද අඛණ්ඩ සාකච්ඡාය.	පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.65,290,130 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.36,103,317 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.101,393,447 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අලෙවිකරණය ආශ්‍රිත වියදම් රු.97,945,655 කින් සහ ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් රු.3,550,276 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රු.80,342,145 ක ස්ථාවර තැන්පතුවක් එහි වසරක කල්පිරීමේ දිනයට දින 22 කට පෙර ආපසු ලබාගෙන තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කාර්යාංශයට සිදු වූ පාඩුව රු.2,956,810 කි.	Southern MICE Expo සහ IMEX සඳහා අරමුදල් අවශ්‍ය වූ බැවින් සහ 2024 මාර්තු සඳහා වන සංචාරක සංවර්ධන බදු තවමත් ලැබී නොතිබුණු බැවින්, ඒ අවස්ථාවේ මුදල් සඳහා ඇති හදිසි අවශ්‍යතාවය හේතුවෙන් ස්ථාවර තැන්පතු ආපසු ලබා ගන්නා ලදී.	පුරෝකථනය කරන ලද මුදල් ප්‍රවාහය නිවැරදිව සකස් කළ යුතු අතර ඒ අනුව ආයෝජනය කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2005 අංක 38 දරන සංචාරක පනත යටතේ සම්මේලන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ලෙස වෙනම ආයතන ස්ථාපිත කර තිබුණද, ආයතන දෙකම ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධනය සඳහා අලෙවිකරණය සහ ප්‍රවර්ධනය හා සම්බන්ධ සමාන අරමුණුවලින් යුක්ත වේ. MICE EXPO සහ අනෙකුත් ප්‍රදර්ශන වැනි ඇතැම් වැඩසටහන් ඒකාබද්ධව මෙහෙයවා තිබුණි. 2021 නොවැම්බර් 26 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීමේදී මෙම කාරණය සාකච්ඡා කරන ලද අතර, එහිදී සම්මේලන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ඒකාබද්ධ කිරීමට නියෝග නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, පොදු ව්‍යාපාර කාරක සභා නියෝගවලට අනුකූල නොවී, එකම අරමුණ සඳහා වෙනම පිරිවැය දරමින් ස්වාධීනව ආයතන ක්‍රියාත්මක වීම දිගටම සිදු කර තිබුණි.	දැනට පැවැත්වෙන ප්‍රතිපත්ති සාකච්ඡාවලදී කෝප් කමිටුවේ නිර්දේශ සලකා බලනු ලැබේ.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව සම්මේලන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ඒකාබද්ධ කිරීම සිදු කළ යුතුය.

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති හා අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ (SOE) 3.4 ඡේදයට අනුව, සෑම රජය සතු ව්‍යවසායක් සඳහාම අනුප්‍රාප්තික සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කාර්යාංශය අද දක්වා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි.	බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) මත පදනම්ව සේවක තනතුරු බඳවා ගැනීම සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක වන අතර, වත්මන් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව සියලුම තනතුරු පුවත්පත්වල (භාෂා තුනෙන්ම) ප්‍රචාරය කළ යුතුය.	කාර්යාංශය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි රජය සතු ව්‍යවසායන් සඳහා වන යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.3 ඡේදයට අනුව , වසර පහක කාලයක් සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. තවද, ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව සෑම වසරකම සැලැස්ම යාවත්කාලීන කළ යුතු අතර, ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර, මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, කාර්යාංශය සඳහා උපායමාර්ගික සැලැස්මක් 2020-2023 දක්වා වූ වර්ෂ හතරක කාලසීමාවක් සඳහා සකස් කර තිබූ අතර එය මෙදින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි.	අඛණ්ඩව සිදුවන ප්‍රතිපත්ති සංවාද සහ සංචාරක ආයතන ඒකාබද්ධ, මේ ක්‍රියාවලිය කිරීම හේතුවෙන් පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම ප්‍රමාද වී ඇත.	උපායමාර්ගික සැලැස්ම වර්ෂ පහක කාලයක් සඳහා සකස් කළ යුතු අතර සෑම වර්ෂයකම යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය.